# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/45 - 2022 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2022.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය අනනුකූල කරමින් ඌව පළාත තුළ පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම සඳහා වූ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හා ඊට අදාළ හෝ අනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා පනවා ඇති ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 2 දරන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ 2011 අංක 2 දරන ප්‍රඥප්තියේ 2(3)(අ)(III) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා, කතරගම ප්‍රාදේශීය සභාවේ කටයුතු 2022.05.09 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවා පරීක්ෂණයක් සිදු කොට වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2279/10 හා 2022.05.09 දිනැති *ගැසට් නිවේදනය* මගින්, අධිකරණ නිලධාරි, විශ්‍රාමලත් අධිකරණ විනිසුරු එච්. එම්. ආර්. අනුර කුමාර මහතා පත්කරන ලදී.

එම පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු පවත්වාගෙන යාමේදී ඇති වූ ප්‍රායෝගික ගැටළු සැලකිල්ලට ගනිමින් එම පරීක්ෂණ වාර්තාව ලබා දීමේ කාල සීමාව 2022 අගෝස්තු 09 වැනි දින සිට 2022 සැප්තැම්බර් 09 වැනි දින දක්වා දීර්ඝ කරන බව මෙයින් දැනුම් දෙමි.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2022 අගෝස්තු මස 04 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 8 - 0062


1A - PG 5916 — 08 (2022/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*